Advanced Level

# CHEMISTRY

## අකාබනික රසායනය
## s ගොණුව




Sasintha Madushan
BSc(Hons)
0712470326

**s ගොනුවේ මූලද්‍රව්‍යය**

1 (IA) වන කාණ්ඩයේ හා 2 (II A) වන කාණ්ඩයේ මූලද්‍රව්‍යය වල ගුණ

| 1 කාණ්ඩය | | | $T_m/°C$ | $T_b/°C$ | $AR/nm$ | $IR/nm$ | $IE/kJmol^{-1}$ | $E^{\phi}/V$ |
|---|---|---|---|---|---|---|---|---|
| Li | 3 | $1s^2\ 2s^1$ | 180 | 1330 | 0.15 | 0.06 | 519 | -3.05 |
| Na | 11 | $(Ne)3s^1$ | 98 | 892 | 0.19 | 0.10 | 494 | -2.71 |
| K | 19 | $(Ar)4s^1$ | 64 | 760 | 0.23 | 0.13 | 418 | -2.93 |
| Rb | 37 | $(Kr)5s^1$ | 39 | 688 | 0.24 | 0.15 | 402 | -2.92 |
| Cs | 55 | $(Xe)6s^1$ | 39 | 690 | 0.26 | 0.17 | 376 | -2.92 |
| Fr | 87 | $(Rn)7s^1$ | විකිරණශීලි මූලද්‍රව්‍යකි, කෘත්‍රිමව නිපදවාගනී | | | | | |
| 2 කාණ්ඩය | | | | | | | | |
| Be | 4 | $1s^2\ 2s^2$ | 1280 | 2770 | 0.11 | 0.03 | 2260 | -1.85 |
| Mg | 12 | $(Ne)3s^2$ | 650 | 1110 | 0.16 | 0.07 | 2180 | -2.37 |
| Ca | 20 | $(Ar)4s^2$ | 840 | 1440 | 0.20 | 0.10 | 1740 | -2.87 |
| Sr | 38 | $(Kr)5s^2$ | 768 | 1380 | 0.21 | 0.11 | 1608 | -2.89 |
| Ba | 56 | $(Xe)6s^2$ | 714 | 1640 | 0.22 | 0.13 | 1468 | -2.91 |
| Fr | 88 | $(Rn)7s^2$ | විකිරණශීලි මූලද්‍රව්‍යකි | | | | | |

s ගොනුවේ ලෝහ ස්වාභාවිකව පවතින ආකාර

| | |
|---|---|
| ආකර ලුණු | $NaCl$ |
| මුහුදු ජලය | $NaCl, MgCl_2, CaCl_2, CaSO_4, Ca(HCO_3)_2\ , MgSO_4$ |
| සිල්වින් | $KCl$ |
| බොරැක්ස් | $Na_2B_4O_7.10\ H_2O$ |
| බෙරිල් | $3\ BeO.Al_2O_3.6\ SiO_2$ |
| මැග්නසයිට් | $MgCO_3$ |
| ඩොලමයිට් | $CaCO_3\ .MgCO_3$ |
| හුනුගල් | $CaCO_3$ |
| කිරිගරුඬ | |
| බෙලි කටු | |
| ජිප්සම් | $CaSO_4.2\ H_2O$ |
| ෆ්ලුවොස්පාර් | $CaF_2$ |
| ඇපටයිට් | $Ca_5(PO_4)_3\ X$ හෙවත් $3Ca_3(PO_4)_2.CaX_2$ $(X = F, Cl)$ |

සෝඩියම් නිස්සාරණය (ඩවුන්ස් කෝෂ ක්‍රමය)

සෝඩියම් නිස්සාරණය කෙරෙනුයේ විලීන $NaCl$ විද්‍යුත් විච්ඡේදනය කිරීමෙනි. $CaCl_2$ එකතු කිරීමෙන් ද්‍රවාංකය 600 ℃ දක්වා අඩු කර ගත හැකි ය.




කැතෝඩයේ දී $Na^+_{(l)} + e \longrightarrow Na_{(l)}$

ඇනෝඩයේ දී $2\ Cl^-_{(l)} \longrightarrow Cl_{2(g)} + 2e$

ක්ලෝරීන් වායුව හා සෝඩියම් ලෝහය අතර ප්‍රතික්‍රියාව වැළැක්වීමට ඇනෝඩය හා කැතෝඩය වෘත්තාකාර වානේ දැල් ප්‍රාචීරයකින් වෙන් කර ඇත. කෝෂය තුළින් අඩු විභව අන්තරයක් යටතේ ඉහළ විද්‍යුත් ධාරාවක් යවනු ලැබේ.

<u>s ගොනුවේ ලෝහ ප්‍රතික්‍රියා.</u>

ජලය සමඟ ≫

| | |
|---|---|
| $Li$ | $Be$ |
| $Na$ | $Mg$ |
| $K$ | $Ca$ |
| $Rb$ | $Sr$ |
| $Cs$ | $Ba$ |

$Be$ ← ජලය හා ක්‍රියා නොකරයි

සිසිල් ජලය හා ක්‍රියා කරයි (Li, Na, K, Rb, Cs)
$M + H_2O \longrightarrow MOH + H_2$

$Mg$ ← සිසිල් ජලය හා ක්‍රියා නොකරයි
උණු ජලය හා හුමාලය සමඟ ක්‍රියා කරයි
උණු ජලය $Mg + H_2O \longrightarrow Mg(OH)_2 + H_2$
හුමාලය $Mg + H_2O \longrightarrow MgO + H_2$

තනුක හා සාන්ද්‍ර අම්ල සමඟ ≫

සියළුම s ගොනුවේ ලෝහ තනුක හා සාන්ද්‍ර අම්ල සමඟ ක්‍රියා කරයි. අධි ක්‍රියාශීලී ලෝහ ස්පෝටනය වේ.

තනුක $H_2SO_4 + Mg \longrightarrow MgSO_4 + H_2$

සාන්ද්‍ර $H_2SO_4 + Mg \longrightarrow MgSO_4 + SO_2 + H_2O$

ඔක්සිජන් සමඟ ≫

ඔක්සිජන් හා රත් කල විට

$Li$ ⟶ ඔක්සයිඩ් සාදයි

$Na$ ⟶ පෙරොක්සයිඩ් සාදයි.

$K$ $Rb$ $Cs$ ⟶ සුපරොක්සයිඩ් සාදයි.

දෙවන කාණ්ඩයේ ලෝහ ඔක්සිජන් හා රත් කල විට ඔක්සයිඩය ගෙනදේ.

$\boldsymbol{Sr}$ හා $\boldsymbol{Ba}$ වැඩිපුර ගෙන දෙන්නේ පෙරොක්සයිඩය වේ.

$K_2O + H_2O \longrightarrow KOH$

$K_2O_2 + H_2O \longrightarrow KOH + H_2O_2$

$KO_2 + H_2O \longrightarrow KOH + H_2O_2 + O_2$

නයිට්‍රජන් සමඟ ≫

| | |
|---|---|
| $Li$ | $Be$ |
| $Na$ | $Mg$ |
| $K$ | $Ca$ |
| $Rb$ | $Sr$ |
| $Cs$ | $Ba$ |

නයිට්‍රජන් හා ක්‍රියා නොකරයි (Na, K, Rb, Cs)

නයිට්‍රජන් හා ක්‍රියා කරයි (Li, Be, Mg, Ca, Sr, Ba)
$M + N_2 \longrightarrow M_3N_2$

ඇමෝනියා සමඟ ≫

| | |
|---|---|
| $Li$ | $Be$ |
| $Na$ | $Mg$ |
| $K$ | $Ca$ |
| $Rb$ | $Sr$ |
| $Cs$ | $Ba$ |

ඇමෝනියා හා ක්‍රියා කරයි (Na, K, Rb, Cs)
$M + NH_3 \longrightarrow MNH_2 + H_2$

ඇමෝනියා හා ක්‍රියා කරයි (Li, Be, Mg, Ca, Sr, Ba)
$M + NH_3 \longrightarrow M_3N_2 + H_2$

$MNH_2 + H_2O \longrightarrow MOH + NH_3$
$M_3N_2 + H_2O \longrightarrow M(OH)_2 + NH_3$
හයිඩ්‍රජන් සමඟ ≫
සියළුම s ගොනුවේ ලෝහ හයිඩ්‍රජන් සමඟ රත් කල විට හයිඩ්‍රයිඩ් සාදයි
$M + H_2 \longrightarrow MH$
$M + H_2 \longrightarrow MH_2$

$MH + H_2O \longrightarrow MOH + H_2$






s ගොනුවේ ලෝහ හඳුනාගැනිම සඳහා සිදු කරන පහන්සිළු පරීක්ෂාවේ (Flame test)




| | |
|---|---|
| *Li* | තද රතු |
| *Na* | කහ |
| *K* | දම් |
| *Rb* | රතු |
| *Cs* | නිල් |
| *Be* | අවර්ණ |
| *Mg* | අවර්ණ |
| *Ca* | තැඹිලි |
| *Sr* | ක්‍රිම්සන් රතු |
| *Ba* | ඇපල් කොළ |
| *Cu* | තද කොළ |

s ගොනුවේ ලෝහ සංයෝග වල තාප වියෝජනය

s ගොනුවේ ලෝහ $X^-$, $O^{2-}$, $S^{2-}$, $SO_3^{2-}$, $SO_4^{2-}$, $PO_4^{3-}$ තාප වියෝජනය නොවේ.

හයිඩ්‍රොක්සයිඩ් ≫

| | |
|---|---|
| ***Li*** | ***Be*** |

| | |
|---|---|
| $Na$ | $Mg$ |
| $K$ | $Ca$ |
| $Rb$ | $Sr$ |
| $Cs$ | $Ba$ |

තාප වියෝජනය නොවේ → $Na, K, Rb, Cs$

තාප වියෝජනය වේ → $Mg, Ca, Sr, Ba$

$M(OH)_2 \longrightarrow MO + H_2O$

කාබනේට ≫

| | |
|---|---|
| $Li$ | $Be$ |
| $Na$ | $Mg$ |
| $K$ | $Ca$ |
| $Rb$ | $Sr$ |
| $Cs$ | $Ba$ |

තාප වියෝජනය නොවේ → $Na, K, Rb, Cs$

තාප වියෝජනය වේ → $Mg, Ca, Sr, Ba$

$MCO_3 \longrightarrow MO + CO_2$

බයිකාබනේට ≫

| | |
|---|---|
| $Li$ | $Be$ |
| $Na$ | $Mg$ |
| $K$ | $Ca$ |
| $Rb$ | $Sr$ |
| $Cs$ | $Ba$ |

තාප වියෝජනය වේ → $Na, K, Rb, Cs$

$MHCO_3 \longrightarrow M_2CO_3 + CO_2 + H_2O$

**බයිකාබනේට ඝන අවස්ථාවේ නොපවතී.**
**ජලීය ද්‍රාවණ අවස්ථාවේ පවතී.** → $Mg, Ca, Sr, Ba$

තාප වියෝජනය වේ

$M(HCO_3)_2 \longrightarrow MCO_3 + CO_2 + H_2O$

නයිට්‍රේට් ≫

| | |
|---|---|
| $Li$ | $Be$ |
| $Na$ | $Mg$ |
| $K$ | $Ca$ |
| $Rb$ | $Sr$ |
| $Cs$ | $Ba$ |

තාප වියෝජනය වේ → $Na, K, Rb, Cs$

$MNO_3 \longrightarrow MNO_2 + O_2$

තාප වියෝජනය වේ → $Mg, Ca, Sr, Ba$

$M(NO_3)_2 \longrightarrow MO + NO_2 + O_2$

s ගොනුවේ ලෝහ සංයෝග වල ජල ද්‍රාව්‍යතාවය

| | $OH^-$ | $CO_3^{2-}$ | $SO_4^{2-}$ | $SO_3^{2-}$ | $PO_4^{3-}$ | $C_2O_4^{2-}$ | $CrO_4^{2-}$ |
|---|---|---|---|---|---|---|---|
| $Na^+$ | **X** | **X** | **X** | **X** | **X** | **X** | **X** |
| $K^+$ | **X** | **X** | **X** | **X** | **X** | **X** | **X** |
| | | | | | | | |
| $Be^{2+}$ | ↓↓ | ↓↓ | **X** | **X** | ↓↓ | **X** | **X** |
| $Mg^{2+}$ | ↓↓ | ↓↓ | **X** | **X** | ↓↓ | **X** | **X** |
| $Ca^{2+}$ | ↓ | ↓↓ | ↓ | ↓ | ↓↓ | ↓ | **X** |

ද්‍රාව්‍යය – **X**
මද වශයෙන් ද්‍රාව්‍යය – ↓
අවක්ෂේප – ↓↓

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| $Sr^{2+}$ | X | ↓↓ | ↓↓ | ↓↓ | ↓↓ | ↓↓ | X |
| $Ba^{2+}$ | X | ↓↓ | ↓↓ | ↓↓ | ↓↓ | ↓↓ | ↓↓ |

- පළමු කාණ්ඩයේ $Li_2CO_3$ හා $Li_3PO_4$ සුදු අවක්ෂේප වේ.
- $BaCrO_4$ කහ පැහැ වේ. අනෙකුත් අවක්ෂේප සියල්ල සුදු පැහැ වේ.
- දෙවන කාණ්ඩයේ $SO_4^{2-}$ හැරුණුකොට අනෙකුත් සියළු අවක්ෂේප තනුක අම්ල වල දිය වේ.

**1.** $Li$ , $Na$ , $K$ ලෝහ සාම්පල හා ලෝහ කාබනේට සාම්පල සපයා ඇත. රසායනාගාරයේදී ඒවා හඳුනා ගන්නා අන්දම වෙන වෙනම පැහැදිලි කරන්න.

**2.** $NaHCO_3$ සාම්පලයක් නියත ස්කන්ධයක් ලැබෙන තෙක් තදින් රත් කල විට ස්කන්ධය අඩුවීමේ ප්‍රතිශතය සොයන්න.

**3.** $Na_2CO_3 : Li_2CO_3$ $1:1$ මවුල අනුපාතයෙන් යුත් සාම්පලයක් නියත ස්කන්ධයක් ලැබෙන තෙක් තදින් රත් කල විට ස්කන්ධය අඩුවීමේ ප්‍රතිශතය සොයන්න.

**4.** පහත සංයෝග සලකා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| | | | | |
|---|---|---|---|---|
| $NaHCO_3$ | $NaHSO_3$ | $NaHSO_4$ | $Li_2CO_3$ | $NaNO_3$ |
| $ZnCO_3$ | $LiHCO_3$ | $Mg(HCO_3)_2$ | $LiOH$ | $KOH$ |
| $Mg(OH)_2$ | $LiNO_3$ | $KNO_3$ | $Mg(NO_3)_2$ | |

- **i.** ජල ද්‍රාව්‍යතාවය අඩුතම සංයෝග මොනවාද ?
- **ii.** රත් කල විට වියෝජනය නොවන සංයෝග මොනවාද ?
- **iii.** වඩාත්ම භාෂ්මික සංයෝගය කුමක්ද ?
- **iv.** රත් කල විට $NO_2$ ලබා දෙන සංයෝග මොනවාද ?
- **v.** කාමර උෂ්ණත්වයේදී ඝන අවස්තාවේ නොපවතින සංයෝගය කුමක්ද ?
- **vi.** වඩාත්ම ආම්ලික සංයෝගය කුමක්ද ?
- **vii.** රත් කල විට $O_2$ පමනක් ලබා දෙන සංයෝගය කුමක්ද ?

**5.** $Na_2CO_3$ හා $NaHCO_3$ පමනක් අඩංගු මිශ්‍රණයක ස්කන්ධය $5\ g$ වේ. එම මිශ්‍රණය නියත බරක් ලැබෙන තෙක් රත් කල විට ලැබෙන ශේෂයේ ස්කන්ධය $3.77\ g$ වේ. මිශ්‍රණයේ බර අනුව $Na_2CO_3$ ප්‍රතිශතය සොයන්න.

**6.** $Na$ සංරසය මිශ්‍රණයක $5.84\ g$ ක් වැඩිපුර ජලය සමග සම්පූර්නයෙන්ම ප්‍රතික්‍රියා කල විට ස. උ. පි. හිදී ලැබුනු $H_2$ පරිමාව $896\ cm^3$ විය. මිශ්‍රණයේ බර අනුව $Na$ ප්‍රතිශතය සොයන්න.

**7.** පහත සංයෝග $H_2O$ හා $D_2O$ සමග දක්වන ප්‍රතික්‍රියා සඳහා තුලිත සමීකරන ලියන්න.
i) $Na$ ii) $NaH$ iii) $CaC_2$ iv) $BiCl_3$ v) $NaNH_2$

**8.** $CaCO_3$ හුනුගල් වල ප්‍රධාන සංඝටකය වේ. එක්තරා හුනුගල් නියැදියකින් $2.50\ g$ ක් නියත බරක් ලැබෙන තෙක් රත් කල විට ලැබෙන ශේෂයේ ස්කන්ධය $1.62\ g$ වේ. මිශ්‍රණයේ බර අනුව $CaCO_3$ ප්‍රතිශතය සොයන්න.

**9.** $CaCO_3$ හා $MgCO_3$ ඩොලමයිට්ටිය පාෂාණ වල විවිධ අනුපාත වලින් අඩංගු වේ. මෙවැනි ඩොලමයිට්ටිය පාෂාණ $2.68\ g$ ක් $1.0\ mol\ dm^{-3}, HCl\ 250\ cm^3$ තුල දිය කරන ලදි. මෙවිට ලැබුනු අඩංගු ද්‍රාවනයෙන් $25\ cm^3$ ක් සමග සම්පූර්නයෙන්ම ප්‍රතික්‍රියා කිරීමට $0.50\ mol\ dm^{-3},\ NaOH\ 38.0\ cm^3$ ක් අවශ්‍ය විය. පාෂාණයේ $CaCO_3 : MgCO_3$ මවුල අනුපතය සොයන්න.

**10.** පහත ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න.
- **i.** $KOH + H_2SO_4 ---\rightarrow$
- **ii.** $NaOH + SO_2 ---\rightarrow$
- **iii.** $KOH + CH_3CH_2COOH ---\rightarrow$
- **iv.** $Na + CH_3CH_2OH ---\rightarrow$
- **v.** $NaOH + CO_2 ---\rightarrow$
- **vi.** $NaH + BCl_3 ---\rightarrow$

**11.** පහත අවස්ථා වලට ගැලපෙන පරිදි $A, B, C, D$ එල ලියන්න.
- **a.** $M = Li$

**b.** $M = Cs$




**12.** පහත අවස්ථාවට ගැලපෙන පරිදි $A, B, C, D$ එල ලියන්න.




**13.** දෙවන කාණ්ඩයේ ලෝහ ඔක්සිජන් සමඟ ක්‍රියාකාරීත්වය සන්සන්දනය කරන්න.
පහත අවස්ථාවට ගැලපෙන පරිදි $A, B, C, D, E$ එල ලියන්න.




**14.** $NaOH, (NH_4)_2CO_3, ZnCl_2, BaCl_2$ ජලීය ද්‍රාවණ හතරක් වෙන වෙනම සපයා ඇත. මෙම ද්‍රාවණ පමණක් යොදා ගනිමින් එක් එක් ද්‍රාවණය වෙන්කර හඳුනාගන්න.